
# අසිරිමත් සංගීත කලා ප්‍රාඥයෙකුගේ නික්ම යෑම


ආචාර්ය ප්‍රේමසිරි කේමදාස (මාස්ටර්)

**ආ**චාර්ය ප්‍රේමසිරි කේමදාසයෝ සිය අසාමාන්‍ය සංගීත කලා යුග මෙහෙවර නිමවා දැයෙන්ද සමුගෙන ගොස් සිටිති. ආචාර්ය කේමදාසයෝ වූ කලී නිසැකයෙන්ම විසිවන සිය වසෙහි ආසියානු කලාපය තුළ බිහිව, සිය සෞන්දර්ය සංගීත කලා ප්‍රතිභාවෙන් එය බැබළවූ ප්‍රාඥයන් ස්වල්ප දෙන අතරට අයත් වන්නාහුය. එමතු නොව කේමදාසයන්ගේ සංගීත ප්‍රතිභාව පෙරදිගින් අපර දිගට විහිදී ගියේ ය.

සුප්‍රකට **පානදුරා වාදයට** නිජබිම වූ පානදුර නම් පුරවරයෙහි සාමාන්‍ය පවුලක උපන් කේමදාසයන්ට ළමාවියක් නොවූ තරම්ය. ඔවුන්ගේ භෞතික ජීවිතය අඟහිඟකම් වලින් සමෘධිමත්ව තිබුණු බව ඔවුන් විසින්ම නොයෙක්වර ප්‍රකාශකරනු ලැබ තිබිණ.


එනිසාම ඔහුගේ අධ්‍යාපනය ද පානදුර ශාන්ත ජෝන් විදුහලෙන් ඔබ්බට නොගියේ ය. මේ විදුහලින් බිහිවූ කීර්තිමත් ලංකාපුත්‍රයින්සේ ගෞරවයට පාත්‍රවී සිටින මහාචාර්ය ගුණපාල මළලසේකර, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන, ලලිත් ඇතුළත්මුදලි හා එදිරිවීර සරච්චන්ද්‍ර ආදී නාමාවලියට කේමදාසයෝද එක්ව සිටිති. කේමදාසයන්ගේ හැට නව වන ජන්ම දිනය නිමිත්තෙන් ශාන්ත ජෝන් විදුහල් මව ද ඔහුට හරසර දැක්වූවා ය.

ආචාර්ය කේමදාසයෝ මෙරට කිසිදු සංගීත පරපුරකට හෝ ශාස්ත්‍රාලයකට හෝ අයත් නොවූහ. භාරතීය රාගධාරී සංගීත ගුරු කුලයකටද අයත් නොවූහ. එහෙත් ඔහු අපූර්ව ප්‍රතිභාවෙන් ද, නිතර ප්‍රගුණ කිරීමෙන් ද තම නිර්මාණ කලා පෞරුෂය වර්ධනය කරගත්තේය. උතුරු ඉන්දීය හෝ දකුණු ඉන්දීය හෝ සංගීතය හැදෑරීමෙන් පමණක් විශ්ව කලා නිකේතනයේ දොරටුව ළඟටවත් යා නොහැකි බව අවධාරණය කළ කේමදාසයෝ එකී සීමාවන් තුළ නොරැඳෙමින් පෙර අපර දෙදිගමවූ සම්ප්‍රදායන් නිදහස්ව ඇසුරුකරමින් සිය සංගීත නිර්මාණ ආඪ්‍ය කරගත්හ.

සිංහළ ගීතයේ සිට නාට්‍යය, සිනමාව, ටෙලිනාට්‍යය, ඔපෙරාව හා කැන්ටාටාව දක්වා විහිදී ගිය කේමදාසයන්ගේ නිර්මාණ වෙන වෙනම මෙහිලා දැක්විය නොහැක. ඒ සඳහා ප්‍රමාණික සංගීත ඥානයක් ද වුවමනාවේ. එහෙත් සංගීත රසිකයෙකු ලෙස බලද්දී නම් අපට කිවහැක්කේ **කේමදාස යුගය** නමින් සුපැහැදිලි යුගයක් වන බවය. එය ලාංකික රසික පරපුර විශ්ව සංගීත ක්ෂෙත්‍රය වෙත රැගෙන යාමට කළ අරගලයක ප්‍රතිඵලයකි.

සංගීතය යනු ගීතයටම සීමාවූවක් නොව ඉන් එහාට යන පුළුල් වින්දනයක් බව කේමදාසයෝ පළමුව පසක්කරගත්හ. ඉන්පසු එහි යාමට විශ්ව සංගීතයෙහි විවිධ නිර්මාණ අභ්‍යාස කළහ. **මානසවිල, දොරමඬලාව, පිරිනිවන් මංගල්‍යය, වර්ණදාසී** මෙන්ම මුල්කාලයේ බිහි වූ **කැලෑමල්, සිංහළ අවුරුද්ද, නියඟය, වැස්ස, මගේ කාලයේ මවුනි,** ආදී ඔවුන්ගේ නිර්මාණ එයට සාක්ෂි දරනු ඇත.

ආචාර්ය කේමදාසයන් විසින් සිංහළ සිනමාවට කරනලද විශිෂ්ඨ සම්ප්‍රදානය පිළිබඳව සඳහන් කළ යුතුය. වාණිජ චිත්‍රපට මෙන්ම කලාත්මක චිත්‍රපට සඳහා ද වඩාත් සිනමාරූපී සංගීතයක් බිහිකිරීමට කේමදාසයෝ පුරෝගාමීවූහ. **සැනසුම කොතැනද** චිත්‍රපටයෙන් චිත්‍රපට සංගීතය මෙන්ම චිත්‍රපට පසුබිම් ගීතයද වෙනස්මගකට යොමු කළ ඔවුන්ගේ සිනමා සංගීතයේ උසස්ම නිර්මාණයන් ලෙස **ගොළු හදවත, බඹරු ඇවිත්, නිධානය, තුන්වෙනි යාමය,** මෙන්ම **හංසවිලක්** සහ **සිරිමැදුරද** නම් කළ හැකිය. **හන්තානේ කතාව** චිත්‍රපටයේ



තේමාව සඳහා ඔවුන් විසින් භාවිතා කරන ලද්දේ මිනිස් හඬ පමණි.

කේමදාසයන්ගේ සංගීත භාවිතය අරගලයක් බවට පත්වූයේද සම්ප්‍රදාය හිසින් ගත් පරපුරත් ඔහුත් අතර ඇතිවූ ද්වන්ද සටන නිසා බව සඳහන් කළ යුතුය. මේ අරගලය නිසා කේමදාසයෝ විටෙක බෙහෙවින් කුපිත වූහ. සමහරුන් ඔහුගේ නිර්දය විවේචනයට ලක්විය. ඔහුට ගල්ගැසූ බොහෝදෙනෙක් ඔහු තුළ සිටි සොඳුරු කලාකරුවා නුදුටුවෝය.

පණ්ඩිත් අමරදේවයෝ වරක් කේමදාසයන් පිළිබඳව අගනා කීමක් කීහ. “ ඔහුගේ ‘විලස’ එසේ වුවද සිත දැඩි නොමවේ ” යයි අමරදේවයන් **මනමේ** ද උපුටා දක්වමින් කළ ඒ තහවුරුව මට මෙවෙලේ සිහිපත්වේ. මමද කේමදාසයන් හා වාදකර ඇත්තෙමි. එහෙත් ඔවුන්ගේ පිය සමාගමට වැටුණු කල්හි සංගීතය පිළිබඳ මගේ දැනුමද පිරිපහදු විය. ඔහුගේ චරිතයේ ගැබ්වූ අදීනත්වය හා නිර්භය භාවය, අයුක්තිය අසාධාරණය නොඉවසීමේ ගුණය ද මා බොහෝ කලාකරුවන් වෙතින් නොදුටු බව මේ සමුගත් යහපත් සංගීත ප්‍රාඥයා වෙනුවෙන් ලියා තැබිය යුතුමය.

වරක් ඔහුගේ **දොරමඬලාව** ප්‍රසංගය වේදිකා ගතවීමට පෙර දිනක සිදුවූවක් මට මතක්වේ. මෙම ප්‍රසංගය ඉහළම රාජ්‍ය ප්‍රභූවරියකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබිණ. එහෙයින් ප්‍රභූ ආරක්ෂක කණ්ඩායම සුනඛයන්ද කැටුව පැමිණ වේදිකාව පිරික්සමින් සිටියහ. මේවෙලෙහි කේමදාසයෝ එහි නොවූහ. ටික වේලාවකින් එහි පැමිණි ඔහු වේදිකාව මත වෙන්නේ මේ කුමක්දැයි විමතියෙන් ඇසීය. කෙනෙකු කීවේ ආරක්ෂක තත්වය තහවුරුකරගැන්මට එසේ පිරික්සන බවය. එහෙත් කේමදාසයෝ තදින් කුපිතවූහ. “ කලාකරුවන් ගොඩවන වේදිකාවට බල්ලන් දාන්න කිව්වෙ කවුද?” යනුවෙන් ඔහු ප්‍රශ්න කළේය. පිරික්සුම මග නවතා ආරක්ෂකයෝ පිටව ගියහ. පසුදින ප්‍රසංගයට රාජ්‍ය ප්‍රභූවරියගේ සහභාගිත්වය නොවීය. එහෙත් පසු දිනෙක කේමදාසයන්ට සුබපතා එවන ලද ලිපියක් ඔහු අතට ලැබිණ. ඔහු සිනාසෙමින් ඒ ලිපිය මට පෙන්වමින් දරුවෙකු සේ සතුටුවිය.

අප හමුවූ සැදෑ කලෙක හේ සිය භෞතික ජීවිතයද අපට අනාවරණය කළේය. දුප්පත්කමේ අඳුරබිඳිමින් සංගීතයේ සෞන්දර්ය බැබලීම තෙක්වූ ඔහුගේ ජීවිතය අධෂ්ඨානශීලී මිනිසෙකුගේ වීර චාරිකාවක් වැන්න. ජීවිතාභියෝග වලින් අකම්පිතවූ උපේක්ෂාසහගත මනසක් ඔහු තුළ විය. හේ සිය භෞතික ලෝකය බිඳ වැටෙද්දීත් නිර්මාණ ලෝකය තුළ නිරෝගීව ජීවත්වන්නට වෑයම්කළේය.

ආසන්න තෙමසක පමණ කාලය තුළ කේමදාසයන් රෝහල්වල වැඩිපුර කාලයක් ගෙවීය. රෝගී සිරුර නිරෝගි මනසකින් ජයගත හැකිය යන විශ්වාසයද ඔහු තුළ විය. සිය ජීවිත සැඳෑවෙහි වකුගඩු සැත්කමකට භාජනය වූ ඔහු ශරීර සෞඛ්‍යය ගැන ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්වූයේ ද නැත. ඔහුගේ අවසන් නිර්මාණය ලෙස එළිදුටු **අග්නි** ඔපරාවද බිහිවුණේ දුබල ගත මැඩගත් ප්‍රබල සිතින් යයි මම සිතමි.

මා කේමදාසයන් හමුවූ අවසන් දිනය ඔක්තෝබර් 18 වෙනිදාය. කොළඹ පෞද්ගලික රෝහලක දැඩි සත්කාර ඒකකයෙහි වෛද්‍යවරුන් විසින් වටකර ගන්නාලද ඇඳක ඔහු ඉතා අසාධ්‍ය තත්වයෙන් සිටියේය. ඇස හැර බැලුවද ඔහුගේ දර්ශන පථයට මා හසු නොවීය. ඔහුගේ ඇඳ වටා තිබුණේ විවිධ වෛද්‍ය උපකරණ හා මෙවලම්ය. ඒ මොහොතේ කේමදාසයෝ මරු සමග දැඩි අරගලයක නිරතව සිටියහයි දැන් මට හැඟේ. නාසය හා මුව වැසෙන පරිදි යොදා තිබුණු ප්ලාස්ටික් වැස්ම කෘතිම ශ්වසන යන්ත්‍රයකට සම්බන්ධවී තිබිණ. සත්සර මත මෘදුව විහිදුණු ඔහු අතැඟිලි දැඩිව තඩිස්සිවී තිබිණ. වෛද්‍යවරුන්ගේ මුහුණුවල සටහන් වූයේ ගැඹුරු නිහඬතාවකි.

එදින රාත්‍රියෙහිද මම යළිත් රෝහළ වෙත ගියෙමි. කේමදාස මහත්මිය ද, දියණියෝ දෙදෙනද, අග්නි ඔපරාවේ මුල් පිටපත රචනා කළ එරික් ඉලයප්පාරච්චිද, කේමදාස පදනමෙහි ශිෂ්‍ය ශිෂ්‍යාවෝද එහි වූහ. පසුදින මට ලංකාවෙන් පිටව යෑමට තිබිණ. මා එතැනින් නික්ම ආවේ කිව නොහැකි තරම් දුකෙනි.

කේමදාසයන් මියගිය පුවත ලන්ඩනයේ දී මා ඇසූ කල්හි මා තුළ බලවත් සංවේගයක් උපනි. ඔහුගේ අවසන් ගමනට නෑ හිතවතුන් අතර රැඳී සොහොන්බිමට යෑමට තරම්වත් දෛවය අපට ඉඩදී නැත. සාද කතා මැද විසිතුරු සැඳෑවන්හි අප ඔබ හා ගෙවූ ප්‍රිය සමාගම් ඉතින් නිමවීය. ජීවිතය මරණයටදැයි සිතෙන තරමටම මරණය වේලාසනින්ම ඔබ වෙත එළඹීම අප හඬවන්නකි. එහෙත් සැබෑව එයයි.

ඔබ දැයෙන් සමුගෙන යන ඒ අවමඟුල් පෙරහැර අතර මා නොවීම ගැන මගේ හද කම්පාවෙයි. එහෙත් එහි යන සිය දහසක් දෙනා අතරට දුරු රටක සිට එන මේ කඳුළින් බරවූ සුසුම්ද එක්කිරීමට මට ඉඩ දුන මැනවි.

මගේ කාලයේ අසිරිමත් සංගීත ප්‍රාඥයෙකුගේ මියැසි මෙහෙවර නිමවී තිබේ. සොඳුරු විසිතුරු යුගයක් ඉතිහාසයට එක්වී තිබේ. අපට එය මාස්ටර්ගේ යුගයයි. රටට හා ලොවට එය කේමදාස යුගයයි. ප්‍රේමසිරි කේමදාස පදනමෙන් සුපිපි පියුම් ඔබ යන මග දෙපස මල් පෙරහැරක් සේ රැඳෙන අයුරු මම දකිමි. සරස්වතිය ඇස මතුවන කඳුළු මල් පිසින් නට දෙව්ලොව සිට ඔබ මැ සුරත දිගු කරනු මැනවි.

*පැ රස මියැසි පෙළහර විය අසමාන*
*මේදෙස එයින් පිබිදුණි ලෙස අපමාන*
*ඒ යස ලොවට විය ඉමහත් අබිමාන*
*මා ඇස කඳුළ සතුටකි ඉන් සුහදාන*

**♦ ගාමිණි සුමනසේකර**
**දිවයින ප්‍රධාන කතෘ**
**ලන්ඩනයේ දී**





මුල් යුගයේ අහස් යානයක්

## මැට් බළලා මීයන් අල්ලන හැටි

**ගි**ය අවුරුද්දෙ 2007 මාර්තු මාසෙ ශ්‍රීලංකාවෙ පුවත්පතක පළවූ ප්‍රවෘත්තියකින් අද අඩහැරය පටන්ගන්න මං කල්පනා කළා. ඒ ප්‍රවෘත්තිය මෙහෙමයි.

*“ කටුනායක ගුවන් හමුදා කඳවුරට 2007 මාර්තු මස 26 වෙනි දින එනම් ඊයේ මධ්‍යම රාත්‍රිය පසුවී 12. 45 ට කොටින්ගේ සැහැල්ලු ගුවන් යානයක් එල්ල කළ බෝම්බ පහරකින් ගුවන් හමුදා සෙබළු 3 දෙනෙක් මියගිය අතර 16 දෙනෙක් තුවාල ලැබූහ. සැක කටයුතු ගුවන් යානයක් කළුවරේම පියාසර කරන බව යුදහමුදා කඳවුරු කීපයකින් ඊට පැයකට පෙර රෑ 11. 30 ට පමණ කොළඹට දැන්වූවත් ගුවන් හමුදාව එය ගණන්ගෙන නැති බව කියති. මුලින් එක යානාවක් යයි සිතූ නමුදු එතැන යානා දෙකක් වීය. එම යානා දෙකෙන් පැමිණ කොටි 7 දෙනෙක් අධිබලැති බෝම්බ 3 ක් කඳවුරට හෙළා තිබේ. අළුත් වැඩියාව සඳහා එදින රේඩාර් යන්ත්‍ර ගලවා දැමූ දිනයකි. එම දිනයේම කොටි පැමිණියේ ඇතුළතින් ඔත්තුවක් ලැබුණු නිසායයි සැකයක් මතුව ඇත. මෙම යානා විදුලි පහන් නිවාගෙන ඉතා පහතින් ගමන් කළ බව මීගමුවේ වැසියන් දැක තිබේ.*

*මෙම ගුවන් ප්‍රහාරය පිළිබඳ අද උදෑසන අරලියගහ මැඳුරේදී පැවති පුවත්පත් සාකච්ඡාවකදී ජනාධිපතිවරයා මාධ්‍යවේදීන් අමතා කීයේ කොටි සංවිධානයට නැවත එවැනි ගුවන් ප්‍රහාරයකට කිසිදු ඉඩක් නොතබන බවයි.”*

එදා ඒ කොටින්ගේ මුල්ම ප්‍රහාරය ත්‍රිවිධ හමුදාවක් ඇති රජයක් හැටියට ශ්‍රී ලංකා දේශය අවශේෂ ලෝකයා හමුවේ ලැජ්ජාවට හා නිවට තත්වයට පත්කළ කාරණයක්. ත්‍රස්තවාදීන් කණ්ඩායමකට පාබළ, නාවුක හා ගුවන් යන ත්‍රිවිධ හමුදාවක්ම හදාගන්න ඉඩදීපු ලෝකයේ එකම රට ලංකාවයි. කැලේ ඉන්න ත්‍රස්තවාදී කොටි හැතැප්ම සිය ගණනක් ගුවනින් අගනුවරට ඇවිල්ලා බෝම්බ දාලා මිනිස්සුත් මරලා ගියා.

එදා රජයට පක්ෂ මාධ්‍යයේ පෙන්නුම් කළේ ඒ ආවෙ ලයිට් එයාක්‍රාෆ්ට් එකක් (සැහැල්ලු ගුවන් යානයක්) බවයි. ඒකෙන් විශාල හානියක් කරන්න බැරිලු. රජය මේව ගැන හිතන්නෙ බොහොම සැහැල්ලු විදියට බව පේනවා. කරන ප්‍රකාශ කොච්චර අමන, ගොං ඒවද කියලා තේරෙනවා. “ කොටි අහස් යාත්‍රා කෑලි ගෙනැල්ලා අන්න කැලේ තියන් හයිකරනවා” කියලා කවුද කිව්වම, ඒ කාලෙ හිටපු ගුවන් ලොක්ක කිව්වලු “ මොන පිස්සුද ඕයි ඕකුන්ට කොහේද එච්චර දෙයක් කරන්න පුළුවන් ” කියලා. ඒ මැට් මෝල් කතාවට පස්සේ කටුනායක ඇතුළු හත් පලකට හත් වතාවක් කොටි ගුවන් යානා පාවිච්චි කරලා බෝම්බ දැම්මා. අළුත්ම ප්‍රහාරය තමයි සති දෙකකට පෙර කොළඹ කැලණිතිස්ස විදුලි බලාගාර යටත් මන්නාරමේ හමුදා කඳවුරකටත් දාපු බෝම්බ ටික. රජය තවම කියන්නෙත් අර කලින් කියපු නිදහසට කාරණාම තමයි.

දැන් තව දෙයක් කියනවා ඒ කොටි යානා පහතින් පියාසර කල නිසාලු රේඩාර්වලට අහුවුණේ නැත්තෙ උඩින් පියාසර කළා නම් පේනවලු. ඉස්සරට වඩා තාක්ෂණය දියුණු අද දවසෙ ඒක මහ ගොං කතාවක් නේද? එහෙම නම් තියෙන්නෙ බිම ඉඳලා තුවක්කුවකින් වෙඩිතියන්න. ඕනම හතුරු ගුවන් යානයකට ප්‍රති ප්‍රහාර දෙන්න Anti aircraft Missile අපේ ගුවන් හමුදාවට තියනවලු. හැබැයි කොටි අර රට අඹලැලි දඬුමොනරෙන් ඇවිත් පැය දෙකක් ගුවනේ සැරිසරලා, කොළඹටත් අනික් කෙළවරේ තියන මනානාරමටත් බෝම්බ දාලා හිනාවෙවී ගියා. අපේ ගුවන් හමුදාව ඔහේ කරබාගෙන හිටියා. ඉහත බෝම්බ හෙළීම ගැන ලංකාවෙන් නිකුත්කළ එක්තරා ඉංග්‍රීසි ප්‍රවෘත්ති තීරුවක් මම දැක්කා. ඒකෙ තිබුණෙ මේ විදියටයි.

**Jerry-built Acme fly-bucket drops bombs at Kelanitissa power station.**

මෙහි සාමානය තේරුම මේ විදියයි. “ නිකං කෑලි එහෙන් මෙහෙන් අටවලා යන්තම් උඩින් යාගන්න පුළුවන් විදියට හදපු පනිට්ටු යානයකින් කැලණිතිස්ස බලාගාරයට බෝම්බ දාලා”

මේ තවම කියන්නෙ අර ගුවන් ලොක්ක කලින් කී දේමයි. “ ඕකුන්ට පුළුවන්ද ඕයි නිකම් පකිස් පෙට්ටි ලෑලිවලින් හදපු මේ කුණු අහස් යාත්‍රා පඩංගුවකින් ඇවිත් හරියකට බෝම්බයක් දාන්න? ඒවා කොහේ කරන්නද? අපිට තියෙන්නෙ මිග් ”

ඒ මොනව කියලා පාච්චල් කළත් කොටියට කමක් නෑ. **නිදර්සනම්** ඇතුළු කොටි වෙබ් අඩවි කීපයකම තිබුණෙ **වාන් පුලිගල් වීරන්** (ගුවන් කොටි වීරයන්) කියලා. *“ අපේ කොටි වීරයෝ කොළඹ විදුලි බලාගාරයට හා මන්නාරමේ හමුදා කඳවුරට බෝම්බ හෙළා එම යානාවලින් නිරුපද්‍රිතව වන්නි බේස් එකට පැමිණෙති ”* කියලා. *“ ඒවා අහස් යානා නෙවෙයි පකිස්පෙට්ටි කියලා කවුරු බාල්දුකළත් කමක් නෑ, අපි දුන්නනේ ඇටැක් එකක්. බළලා මැටියෙන් හරි කමක් නෑ මීයො අල්ලනවනම් නේද? ”* කියලා එක කොටි වෙබ් අඩවියක තිබුණා. මේවට අඩනවද? හිනාවෙනවද? මට නම් තේරෙන්නෙ නෑ.

**♦ වෙලේගෙදර රාළ London**